**ශීර්ෂය - 205 - මහා භාරකාර දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 205 - මහා භාරකාර දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මහා භාරකාර දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ජූලි 16 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට මහා භාරකාර දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඉකුත් වර්ෂයට අදාල වාර්තාවේ ඡේද යොමුව | ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය | මෙම වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|
| 1.6.1 (ආ) | මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පවත්වා ගැනීමට කටයුතු කර නොතිබුණි. | 1.6.1 (ඇ) |

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) දේපල, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය විසින් 2022 වර්ෂයේදී දෙපාර්තමේන්තුව වෙත ලබා දී අයිතිය පවරා ගෙන තිබූ වාහන දෙකකට අදාළ වටිනාකම තක්සේරු කර මූල්‍ය නොවන වත්කම්වලට ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි. තවද, මෙම මෝටර් රථ දෙකෙහි අළුත්වැඩියා කටයුතු වෙනුවෙන් රු.406,270 ක වියදමක් දරා තිබුණ ද එම රථ ධාවනයට නොයොදවා නිශ්කාර්යව පැවතුණි. | 2023 වර්ෂයේදී අමාත්‍යාංශය විසින් දෙපාර්තමේන්තුව වෙත ලබාදී ඇති අදාළ වාහන දෙක අලුත්වැඩියා කිරීමට වියදම් ඇස්තමේන්තු ලබාගෙන ඇති නමුත් වියදම අධික බැවින්, අපහරණය කිරීම සඳහා නිර්දේශ කර කමිටුව විසින් තක්සේරු වාර්තා ද ලබා දී ඇති අතර ටෙන්ඩර් කිරීම හෝ රජයේ වෙනත් දෙපාර්තමේන්තුවකට පැවරීමට කටයුතු කරමින් පවතී. | දෙපාර්තමේන්තුවට අයත් වාහනවල වටිනාකම් මූල්‍ය නොවන වත්කම්වලට ඇතුළත් කිරීමට ද ඵලදායී ලෙස උපයෝජනය කිරීමට ද කටයුතු කළ යුතුය. |

**(ආ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් හා සේවකයින්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | ඇප තැබිය යුතු නිලධාරීන් හඳුනාගෙන ඉදිරි කටයුතු කරමින් පවතී. | මුදල් රෙගුලාසි 891(1) හි සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ලෙහි වැඩිදියුණු කිරීමේ වියදම්, ගොඩනැගිලි හිමිකරුගේ භාරයෙන් දරනු ලැබුවද, ඒ සඳහා වාර්ෂික ඇස්තමේන්තුවෙන් ද | ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ල සම්පූර්ණයෙන් අලුත්වැඩියා කිරීමේ අවශ්‍යතාවය නිසාත් ඒ සඳහා විශාල මුදලක් වැයවන | හැකිතාක් නිවැරදිව වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය. |

| | | |
|---|---|---|
| ගොඩනැඟිලි සහ ඉදිකිරීම් (2001) යටතේ 2021, 2022 සහ 2023 වර්ෂවල රු.300,000ක් බැගින් ප්‍රතිපාදන වෙන් කර ගැනීම හේතුවෙන් වර්ෂ 03හි පිළිවෙලින් සියයට 40ක්, සියයට 63ක් සහ සියයට 77ක් වශයෙන් අඛණ්ඩව ඉතිරි කිරීම් පැවතුණි. | බවට ඇස්තමේන්තු කර තිබූ නිසාත් ගොඩනැගිල්ල වැඩිදියුණු කිරීමේ වියදම හිමිකරුගේ භාරයෙන් දරා ඇත. ඉදිරියේදී මෙම වැය විෂයය සඳහා අඩුවෙන් ප්‍රතිපාදන ඇස්තමේන්තු කිරීමට සටහන් කර ගන්නා ලදී. | |

**2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම**

| විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවට අදාළ නොවන වැය විෂයය අංක 205-126-2-7-35-2401-12-P යටතේ රු.949,560 ක වටිනාකමින් යුත් බැරකම්, 2023 දෙසැම්බර් 31 දිනට SA-92 භාණ්ඩාගාර පරිගණක මුද්‍රිතය තුළ ඇතුළත්ව තිබුණ ද, ඒ පිළිබඳව භාණ්ඩාගාරයට දැනුම් දී නිවැරදි කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම බැරකම ශීර්ෂ අංක 126 (අධ්‍යාපන අමාත්‍යාංශය) විසින් වැරදීමකින් අප දෙපාර්තමේන්තුවේ ශීර්ෂ අංකය වන 205 ශීර්ෂය යටතට ඇතුළත් කර ඇති අතර එය අවසන් භාණ්ඩාගාර මුද්‍රිත සටහන් වලින් පමණක් අනාවරණය වූ බැවින් නිවැරදි කරන ලෙස රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත දන්වා යවා ඇත. | අප්‍රමාදව භාණ්ඩාගාරයට දැනුම් දී භාණ්ඩාගාර මුද්‍රිතය නිවැරදි කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **වටිනාකම රු.** | **අනුකූල නොවීම** | | |
| (අ) | 1922 අංක 01 දරන මහා භාරකාර ආඥා පනතේ 47(1) වගන්තිය | - | භාර/ බූදල් ගිණුම් වාර්ෂිකව විගණනයට ඉදිරිපත් කළ යුතු වුවත් 2023 වර්ෂයට අදාළ භාර/ බූදල් අවසාන ගිණුම් මෙම වාර්තාවේ දිනය වන විටත් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | 2023 වර්ෂයේ භාර බූදල් අවසාන ගිණුම් සකස් කරමින් පවතින අතර කඩිනමින් ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | අදාල ගිණුම් නියමිත දිනට විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | - | දෙපාර්තමේන්තුව සතු වාහන 9ක් සඳහා ඉන්ධන දහන පරීක්ෂාව සිදු කර නොතිබුණි. | මීට පෙර සියළුම වාහන ඉන්ධන පරික්ෂාවක් සිදු කළ අතර අදාළ කාලසීමාව ඉක්මවා ඇති බැවින් සියළු වාහන සඳහා ඉදිරියේදී, කඩිනමින් ඉන්ධන පරීක්ෂාවක් සිදු කිරීමට නියමිතය. | ඉන්ධන භාවිතය සම්බන්ධයෙන් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2.4 බැංකු ගිණුම් මෙහෙයවීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දිනට භාර/බූදල් සම්බන්ධ බැංකු ගිණුම් 08ක එකතුව රු.14,017,724 ක හර ශේෂයක් ඇතිවන පරිදි වියදම් දරා තිබූ අතර ඉන් භාර/බූදල් 04කට අදාළව එකතුව රු.1,325,481 ක හර ශේෂයන් පියවීම සඳහා එම බූදල්වල කිසිදු ආයෝජනයක් ද නොතිබුණි. | විගණන නිරීක්ෂණය හා එකඟ වේ. | එක් එක් භාරය/බූදලය සඳහා ලැබෙන ආදායම් සීමාව තුළ වියදම් දැරීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලැසුම් කිරීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 කාර්යයසාධන වාර්තාව අනුව විකුණුම් ගාස්තු හා අනෙකුත් ලැබීම් ලෙස ඇස්තමේන්තු කර තිබුණු ආදායම රු.11,000,000 ක් වුවද, රැස් කළ ආදායම, රු.20,714,000 ක් හෙවත් ඇස්තමේන්තුවේ අගයට වඩා සියයට 188 කටත් වැඩි අගයක් විය. මෙය ඇස්තමේන්තු සකස් කිරීමේ දුර්වලතාවයක් බවට නිරීක්ෂණය විය. | වරින් වර පොලී ප්‍රතිශත වෙනස්වීම හා 2023 වසරේ සිට භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කිරීමට ආරම්භ කිරීම නිසා පොලී ආදායම වැඩිවීම හේතුවෙන් ආදායම් ගාස්තු වැඩි ප්‍රමාණයක් අයකර ගැනීමට හැකි විය. | ආදායම් ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ආ) | ක්‍රියාකාරී සැලැස්ම අනුව, භාර/බූදල් අරමුදල්වලට අදාළ ක්‍රියාකාරකම් වෙනුවෙන් පුද්ගල භාර ගෙවීම් රු. මිලියන 14 ක් සහ භාර අරමුණු අනුව වෙනත් ගෙවීම් රු. මිලියන 5.7 ක් ඇස්තමේන්තු කර තිබුණ ද, වැය කිරීම් පිළිවෙලින් රු. මිලියන 22.2 ක් සහ රු.මිලියන 9.8 ක් විය. ඇස්තමේන්තු සකස් කිරීමේ දුර්වලතා මීට හේතු වී ඇති බවට නිරීක්ෂණය විය. | ඇස්තමේන්තුවට වැඩි ආදායමක් ලැබීම හේතුවෙන් වැඩි ප්‍රතිලාභීන් ප්‍රමාණයකට ගෙවීම් කිරීම නිසා සත්‍ය වියදම වැඩි වී ඇත. | සැලසුම් සකස් කිරීමේදී ගෙවීම්වලට අදාළ ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව සකස් කළ යුතු අතර ඊට අදාළ ගෙවීම් ඇස්තමේන්තුගත සීමාව තුළ සිදු කළ යුතුය. |

## 3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුව විසින් හඳුනාගෙන තිබූ කාර්යසාධන දර්ශක අනුව තථ්‍ය නිමවුම, අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක් ලෙස සැලකීමේදී වතු කළමනාකරණ අංශයේ බුදල් 07කට අයත් වතු 11කින් 2023 වර්ෂයේ අපේක්ෂිත ලාභය රු.19,581,285ක් වුවද, ඒවායෙහි රු.5,008,264ක අලාභයක් ඇතිවී තිබුණු අතර එහි ප්‍රතිශතය අපේක්ෂිත ලාභයෙන් සෘණ සියයට 26ක් විය. | විහාර වන්දි නිදහස් කිරීම, ලැබෙන ඉල්ලීම් අනුව සිදු කරනු ලැබේ. අලාභ ලබන වතු බදු දීමට කටයුතු කරගෙන යන බැවින් ඉදිරියේදී මෙම තත්ත්වය නිවැරදි වන බව දන්වමි. | හඳුනාගත් ඉලක්ක ළඟා කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ කාර්යසාධන වාර්තාවෙහි තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කිරීමටත් සහ ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇති ආකාරය පිළිබඳ තොරතුරු ඇතුළත් කිරීමටත් කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී ඒ අනුව කටයුතු කිරීමට එකඟ වේ. | කාර්යසාධන වාර්තාව අදාළ ආකෘතිය අනුව සම්පූර්ණ ලෙස ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ කොටස්වල භාරකාරිත්වය රජය වෙනුවෙන් දරමින් එම සමාගමේ කටයුතු මෙහෙයවීම හා අධීක්ෂණය දෙපාර්තමේන්තුවේ කාර්යභාරයක් වුවද එම කාර්යය දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු නොලබන අතර කාර්යසාධන දර්ශකයක් ලෙස හඳුනා ගැනීමටද කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී කාර්යසාධන දර්ශකයන්ට ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ. | කාර්යභාරය අනුව කාර්යසාධන දර්ශක හඳුනාගත යුතුය. |

## 3.4 පාඩු හා හානි

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වාහනයකට 2007 ජනවාරි 27 දින සිදු වු අනතුර සම්බන්ධයෙන් වු රු.254,038 ක අලාභය, අදාළ රියැදුරුගෙන් අයකර ගැනීම සඳහා අධිකරණයේ පවරා තිබූ නඩුව සම්බන්ධව පසු විපරම් සිදු නොකිරීම හේතුවෙන් කාලාවරෝධය මත නිෂ්ප්‍රභ වී තිබු අතර අනතුර සිදු වී වසර 16 ක් ගත වුවද අදාළ පාඩුව වගකිව යුතු අයගෙන් අය කර ගෙන පොත්වලින් කපා හැරීමට සුදුසු පියවර ගෙන නොතිබුණි. | 2007 ජනවාරි 27 දින වාහනයකට සිදු වූ අනතුර සම්බන්ධයෙන් වූ රු.254,038ක අලාභය ඉදිරියේදී පොත්වලින් කපා හැරීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ. | අලාභය අදාළ පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුය. |

## 3.5 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රිච්මන්ඩ් මන්දිරය නැරඹීමට පැමිණෙන දේශීය විදේශීය සංචාරකයින් හා මන්දිරය පසුබිම් කරගෙන මංගල ඡායාරූප ගැනීමට පැමිණෙන්නන්ට අලෙවි කිරීමට මුද්‍රණය කර තිබූ රු.1,306,250ක් වටිනා ටිකට් පොත්, විධිමත්ව ලේඛනයක ඇතුළත් කිරීමෙන් තොරව අනාරක්ෂිතව ගොඩ ගසා තිබුණි. | වර්තමානයේ ටිකට් පත්වල මිල ගණන් වෙනස් වී ඇති බැවින් අදාළ ටිකට් පොත් ප්‍රමාණයම ප්‍රධාන කාර්යාලය වෙත රැගෙන විත් භාවිතා කළ හැකි ආකාරය පිළිබඳව කටයුතු කරමින් පවතී. | ටිකට් පොත්, විධිමත්ව ලේඛනගත කොට ආරක්ෂිතව ගබඩා කළ යුතුය. |
| (ආ) | ළමා නිවාසය, රිච්මන්ඩ් පාර්ක් වත්ත හා රිච්මන්ඩ් මන්දිරයේ 2022 වර්ෂය අවසානයේ භාණ්ඩ සමීක්ෂණය මගින් ලබා දී තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කිරීමටත්, බඩු වට්ටෝරු පොත්වල ශේෂ යාවත්කාලීන කිරීමටත්, මන්දිරයේ ත්‍රී රෝද රථය | නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතී. | භාණ්ඩ සමීක්ෂණය මගින් ලබා දී තිබූ නිර්දේශ ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ඇතුළු ඇතැම් භාණ්ඩ පොත්වලට ඇතුළත් කිරීමටත් කටයුතු කර නොතිබුණු අතර ළමා නිවාසයේ ක්‍රීඩා භාණ්ඩ තොගයක් ඇතුළුව පොත්වල ඇතුළත් නමුත් භෞතිකව නොපවතින භාණ්ඩ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමටත් කටයුතු කර නොතිබුණි. | | |
| (ඇ) | මහා භාරකාර දෙපාර්තමේන්තුව වෙත ලැබෙන විදේශ වන්දි මුදල් සම්බන්ධයෙන් විධිමත් තොරතුරු පද්ධතියක්, ගෙවිය යුතු වන්දි මුදල් සම්බන්ධයෙන් නිවැරදි කාල විශ්ලේෂණයක් සහ යැපෙන්නන් වෙත කරනු ලබන ගෙවීම් සටහන් කිරීම සඳහා වූ ලේඛනයක් යාවත්කාලීනව විධිමත් අයුරින් පවත්වා ගැනීමට කටයුතු කර නොතිබීමෙන් ගෙවිය යුතු වන්දි මුදල් හඳුනාගත නොහැකි වී තිබුණි. | විදේශ වන්දි අංශය මඟින් 1983 වර්ෂයේ සිට විදේශ වන්දි ලැබීම සම්බන්ධව සියලු තොරතුරු සටහන් කිරීම සඳහා රෙජිස්ටර පොතක් පවත්වාගෙන යනු ලබයි. ඊට අමතරව විදේශ වන්දි පිළිබඳ සියලු තොරතුරු ඇතුළත් පරිගණක ක්‍රමවේදයක් ද මේ වන විට සකසා ඇත | විදේශ වන්දි මුදල් සම්බන්ධයෙන් විධිමත් තොරතුරු පද්ධතියක් පවත්වාගෙන යා යුතුය. |
| (ඈ) | මියගිය පුද්ගලයන් 144 ක් වෙනුවෙන් යැපෙන්නන්/නීත්‍යානුකූල උරුමකරුවන් වෙත 2023 දෙසැම්බර් 31 දිනට ගෙවීමට ඇති වන්දි මුදල රු.122,303,680 ක් වුවද වන්දිලාභීන් හඳුනා ගැනීමේ විධිමත් ක්‍රමවේදයක් වාර්තාවේ දින වන විටත් හඳුනා ගෙන නොතිබුණි. | හඳුනාගැනීමට නොහැකිව පවතින විදේශ වන්දිලාභීන්ගේ ලැයිස්තු පුවත්පත් දැන්වීම් පළකර හඳුනාගැනීමට උත්සහ දරා ඇති අතර එහි දී එක් අයෙක් හඳුනාගත් අතර එකී වන්දි මුදල් මුදාහැරීම පිළිබඳව ඉදිරි කටයුතු සිදුකර ඇත. අනෙකුත් වන්දි මුදල් පිළිබඳව ප්‍රාදේශීය ලේකම් මාර්ගයෙන් තොරතුරු ලබාගැනීම සඳහා කටයුතු සිදුකරමින් පවතී. | අදාළ වන්දි මුදල් නීත්‍යානුකූල උරුමකරුවන් වෙත අප්‍රමාදව ගෙවීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | වයස අවුරුදු 18 සම්පූර්ණ වන තෙක් ස්ථාවර තැන්පතුවල තැන්පත් කර ඇති බාලවයස්කාර | බාලවයස්කරුවන්ගේ තැන්පතු පිළිබඳව පරීක්ෂාකර බලා වයස අවු.18 සම්පූර්ණ වූ අය හඳුනාගෙන ඒ අය ලිඛිතව | අදාළ වන්දි මුදල් නීත්‍යානුකූල උරුමකරුවන් වෙත අප්‍රමාදව |

| | | | |
|---|---|---|---|
| | යැපෙන්නන් 507කට අදාළව 2022 දෙසැම්බර් 31 වන විට පැවති රු.271,744,562 ක් වූ ස්ථාවර තැන්පතුවලින් 404 දෙනෙකුගේ උපන් දිනය හඳුනා ගැනීමටත්, උපන් දිනය හඳුනාගත හැකි අවුරුදු 18ට වැඩි බාලවයස්කරුවන් 21 දෙනෙකු වෙනුවෙන් එකතුව රු. 687,012 ක් වූ වන්දි මුදල් ගෙවීමටත් කටයුතු කර නොතිබුණි. | දැනුවත් කර ස්ථාවර තැන්පතු නිදහස් කර නොමැති අය ගේ ස්ථාවර තැන්පතු නිදහස් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. ඒ සඳහා විදේශ වන්දි අංශය සතු පරිගණකයේ බාලවයස්කාර තැන්පතු පිළිබඳව ලේඛනයක් යාවත්කාලීන කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කර ඇත. ස්ථාවර තැන්පතු පිළිබඳව ලේඛනයක් ද යාවත්කාලීන කරමින් පවත්වා ගෙන යනු ලබයි. | ගෙවීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | 1998 සිට 2004 දක්වා නොගෙවූ විදේශ වන්දි ලෙස හඳුනාගෙන තිබූ රු.2,196,364 ක මුදලක් රාජ්‍ය ආදායමට බැර කර තිබූ අතර 2004 වර්ෂයේදී එකතුව රු.539,090 ක් වූ වන්දි මුදල් නීත්‍යානුකූල උරුමකරුවන්ගේ විස්තර ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ගෙවීමට නොහැකි වී තිබුණ ද ඒවාට අදාළ තොරතුරු ගෙන්වා ගැනීමටත්, ඊට අදාළ ලිපිගොනු සහ තොරතුරු යාවත්කාලීනව විධිමත් පරිදි පවත්වා ගැනීමටත් කටයුතු කර නොතිබුණි. | විදේශ කටයුතු අමාත්‍යාංශයේ කොන්සියුලර් අංශයෙන් මේ පිළිබඳව ලිඛිතව විමසා ඉදිරි කටයුතු සිදු කරමි. ලිපිගොනු යාවත්කාලීන කිරීමට උපදෙස් ලබා දී ඇත. | ලිපිගොනු සහ තොරතුරු යාවත්කාලීනව විධිමත් පරිදි පවත්වාගෙන යාමට සහ විදේශ වන්දි, නීත්‍යානුකූල උරුමකරුවන් වෙත අප්‍රමාදව ගෙවීම් කිරීමට කටයුතු කළ යුතුය. |
| (උ) | එන්.ඩී.එස්.සිල්වා විජේසිංහ බුදල්කරුගේ අන්තිම කැමති පත්‍රය අනුව රිච්මන්ඩ් මන්දිරය ළමා නිවාසයක් බවට පත් කර එංගලන්තයේ ආචාර්ය බර්නාඩෝන්ගේ නිවාසවලට අනුකූල වන ආකාරයට සහ දේශීය තත්ත්වයන්ට යෝග්‍ය වන පරිදි පවත්වා ගෙන යායුතු බව සඳහන් කර තිබුණ ද, මන්දිරය පසෙකින් පිහිටා ඇති වෙනත් ගොඩනැඟිල්ලක ළමුන් 10 | රිච්මන්ඩ් කාසල් මන්දිරය දේශිය හා විදේශ සංචාරකයින්ට විවෘත ස්ථානයක් වන අතර එහි ඇතුළත කාමර දරුවන්ට ආරක්ෂාකාරී නොවේ. තවද, මන්දිරය මේ වන විට අලුත්වැඩියා කළ යුතු තත්ත්වයේ පවතින බැවින් දරුවන් එහි නේවාසිකව තැබිය නොහැක. මේ වන විට දරුවන් 10ක් පමණ රැඳී සිටින අතර දරුවන් කිහිපදෙනෙක් අ.පො.ස සාමාන්‍ය පෙළ | අන්තිම කැමති පත්‍රයේ සඳහන් පරිදි බූදල්කරු ගේ අරමුණ ඉටුවන ආකාරයට ළමා නිවාසය පවත්වා ගෙන යා යුතුය. |

| | | | |
|---|---|---|---|
| | දෙනෙකුටත් අඩු සංඛ්‍යාවක් සහිතව ළමා නිවාසය පවත්වාගෙන යනු ලැබීමෙන් බූදල්කරුගේ ප්‍රධාන අරමුණ ප්‍රමාණවත් පරිදි ඉටුකර නොමැති බවට නිරීක්ෂණය වූ අතර පාලක මණ්ඩල රැස්වීම් නිසි පරිදි පැවැත්වීමට කටයුතු කර නොතිබීමෙන් නිවාසයට අදාළ තීරණ ගැනීමේ දුර්වලතාවයක් පවතින බව ද නිරීක්ෂණය විය. | විභාගය අවසන් කර නිවෙස් කරා නික්ම ගොස් තිබුණි. දිස්ත්‍රික් ලේකම් කාර්යාල 24ක් මඟින් අයදුම්පත් කැඳවා දරුවන් බඳවා ගැනීමට අවශ්‍ය පියවර ගනු ඇත. | |
| (ඌ) | ඩී. එස්. ඩබ්ලිව්. සමරකෝන් බූදලයට අයත් සයිමන්ඩේල්වත්ත ඉඩමෙහි රජයට පවරාගෙන තිබුණු අක්කර 16 රූඩ් 01 පර්චස් 35ක් වෙනුවෙන් තීරණය වූ වන්දි මුදල අවස්ථා දෙකකදී පිළිවෙලින් රු. මිලියන 2.63 ක් සහ රු. මිලියන 1.79 ක් වශයෙන් වටිනාකම් 2ක් කැස්බෑව ප්‍රාදේශීය ලේකම් විසින් දැනුම් දී තිබුණු නමුත් අදාළ වෙනස නිරවුල් කර ගෙන නොතිබුණි. | රජයට පවරා ගත් ඉඩමේ මු.පි. 8043 දරන කොටස ගම් පුළුල්කිරීම යටතේ අඩු ආදායම්ලාභීන් වෙත පවරාදීමට වෙන් කරන ලද ඉඩම් කොටස වේ. අනෙකුත් ඉඩම් කොටස් සඳහා වන්දි සහ ඒ සඳහා පොලී ලැබී ඇත. පිඹුරු අංක 8043 දරන කොටස සඳහා නියමිත වන්දි මුදල හා පොළිය සම්බන්ධයෙන් සහ වන්දි මුදලේ වෙනස සම්බන්ධයෙන් කැස්බෑව ප්‍රාදේශීය ලේකම් වෙතින් විමසීම් කර ඇත. මෙම වෙනස නිරවුල් කිරීමට ප්‍රාදේශීය ලේකම් ඉදිරි නීතිමය කටයුතු සිදු කරමින් පවතින බව දන්වා ඇත. ඒ සම්බන්ධව හා මෙම දෙපාර්තමේන්තුව වෙත ලැබිය යුතු වන්දි මුදල් සම්බන්ධව 2023.03.17 දිනැතිව නැවත විමසීම් කර ඇත. | රජයට පවරාගත් බූදල් ඉඩම්වලට අදාළ වන්දි මුදල් හා පොළී මුදල් බූදලය වෙත ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (එ) | 2013 වර්ෂය දක්වා මනා අයුරින් කළමනාකරණය නොකිරීම හේතුවෙන් වීරසිංහ අබේනායක බූදලයට අයත් මාතර ගබඩා වීදියේ පර්චස් 32 ක් විශාල ඉඩම හා ගොඩනැගිල්ලෙහි අනවසරයෙන් පදිංචි වූ | අධිකරණ නියෝග ප්‍රකාරව දේපල විකුණන තෙක් තාවකාලිකව බදු දී ඇති බව ලිපිගොනු අනුව නිරීක්ෂණය වේ. පසුව අනවසර පදිංචිකරුවෙකු හේතුවෙන් ඔහු ඉවත් කිරීමට නීතිමය කටයුතු සිදු කරන බැවින් | විකිණීම සඳහා අධිකරණ අවසරය ලද ඉඩම් හා ගොඩනැගිලි විකුණා බූදලයේ අරමුණු ඉටු කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අයෙකු ඉවත් කිරීම සඳහා නඩු පවරා තිබුණි. ඒ අනුව දේපළ විකුණා අරමුදලට බැර කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙතෙක් දේපල විකිණීමේ කටයුතු සිදු කළ නොහැකි වී ඇති අතර 2023 ජුලි 04 දින නඩුව කැඳවීමට නියමිතය. | |
| (ඒ) | නුගේගොඩ ප්‍රදේශයේ පදිංචිව සිටි බුදල්කරුවකුගේ බුදලය සම්බන්ධයෙන් මහා භාරකාර තැනට හිමිකමක් නොමැති වුවද ඒ වෙනුවෙන් පැවරුණු නඩුවට අදාළව නීතිඥ ගාස්තු වශයෙන් එකතුව රු.2,962,430 ක් ගෙවා තිබූ අතර තවදුරටත් නීතිඥ ගාස්තු ගෙවිය යුතුව පැවතුණි. | එම බුදලය මඟින් අරමුණු ඉටු කිරීම 2022 වර්ෂයේදී ආරම්භ කර ඇත. බිරිඳගේ දේපල සඳහා බුදල්කරුට හිමි අයිතිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වන්දි සඳහා ඉල්ලුම් කර වන්දි පරීක්ෂණයට යොමු වී ඇති අතර ඒ සඳහා වෙනත් පාර්ශවයක් විසින් හිමිකම් පා ඇති බැවින් ප්‍රාදේශීය ලේකම් විසින් මහා භාරකාරතැන පාර්ශවකරුවකු කරමින් නඩු පවරා ඇත. නඩුවේ තීන්දුව ප්‍රකාරව මහා භාරකාරතැනට වන්දි සඳහා හිමිකම් අහිමි කර ඇතත් මහා භාරකාරතැන වෙනුවෙන් පෙනී සිටි නීතිඥ මහත්වරුන්ට වෘත්තීය ගාස්තු කොටසක් ගෙවීම් කර ඇති අතර නොගෙවූ වෘත්තිය ගාස්තු ද පවතී. | දෙපාර්තමේන්තුවට නෛතික හිමිකමක් ඇති දේපල සම්බන්ධයෙන් පමණක් නඩු කටයුතුවලට සම්බන්ධ විය යුතුය. |
| (ඔ) | හැරී හපුගොඩ බුදලයේ අන්තිම කැමති පත්‍රය ප්‍රකාරව සෑම වසරකදීම බුදලයේ ආදායමින් 1/5 ක් ඉතිරි කර එම ඉතිරිය රු.100,000 ක් වූ විට එය ශිෂ්‍යාධාර පිරිනැමීමට හා ආපදා තත්වයන්හිදී සහන සැලසීමට රැස් කර තැබිය යුතු බව දක්වා තිබුණ ද, එම අරමුණු ඉටු කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් වර්ෂ ගණනාවක සිට ආදායම් ඉතිරි කර නොතිබුණි. එම බුදලෙන් 2021 සහ 2022 වර්ෂවල පමණක් උපයා තිබුණු ආදායම රු. 9,564,983 ක් වූ අතර එයින් ඉතිරි කළ යුතු නමුත් ඉතිරි නොකළ මුදල | හැරී හපුගොඩ බුදලයට අයත් වතුවල හර ශේෂයක් පවතින බැවින් ආදායමින් 1/5 ක් ඉතිරි කර අරමුණු ඉටු කිරීමේ හැකියාවක් ලැබී නැත. ඉදිරියේදී වතු ලාභදායී පදනමින් පවත්වා ගෙන යාමට සැලසුම් සකස් කර ඇත. | අන්තිම කැමති පත්‍රය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | රු.1,912,997 ක් විය. නිසි කළමනාකරණයකින් යුක්තව වතු පාලනය නොකිරීම හේතුවෙන් හර ශේෂයක් ඇතිවීම හේතුවෙන් බුදලයට අදාළ අරමුණු ඉටු කිරීමට නොහැකිව ඇති බවත් නිරීක්ෂණය විය. | | |
| (ඕ) | විවෘත නොකරන ලද අන්තිම කැමති පත්‍ර 54 විවෘත කිරීම සම්බන්ධයෙන් වූ නීති කටයුතු වෙනුවෙන් බුදල්කරුවකුගේ අරමුදල් භාවිතා කර රු.2,629,250 ක් ගෙවා තිබුණු අතර එම බුදලයට අදාළව ඉටුකළ යුතු කාර්යයන් බුදල්කරු විසින් සිය අන්තිම කැමති පත්‍රයෙහි නිශ්විතව සඳහන් කර තිබූ බැවින් මෙම වියදම් දැරීම බුදල්කරුගේ අරමුණුවලට පටහැනි බව නිරීක්ෂණය විය. | අධිකරණ කාර්යයන් අවසානයේදී අන්තිම කැමති පත්‍රවල ඇති දේපළවලින් ප්‍රතිපූර්ණය කිරීමේ පදනමට මහා භාරකාරතැනගේ අභිමතය පරිදි අදාළ බුදලයෙන් ගෙවීම් කර ඇත. නඩුව මෙතෙක් අවසන් වී නොමැත. | බුදල්කරුවන් විසින් අන්තිම කැමති පත්‍රවල නිශ්විතව සඳහන් කර ඇති අරමුණු ඉටු කිරීම සඳහා පමණක් බුදල් දේපල උපයෝජනය කළ යුතුය. |
| (ක) | භාර සහ බුදල් අයත් අංශවලට වෙන් වෙන් වශයෙන් ස්ථාවර වත්කම් ලේඛන නඩත්තු කිරීමටත්, අදාළ ස්ථාවර වත්කම් ක්ෂය කිරීමටත් කටයුතු කර නොතිබුණි. | වෙන් වෙන් වශයෙන් ස්ථාවර වත්කම් ලේඛන පිළියෙල කිරීමට නිලධාරීන් වෙත උපදෙස් ලබා දී ඇත. භාර සහ බුදල්වලට අයත් ස්ථාවර වත්කම් ක්ෂය කිරීම සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා කමිටුවක් පත්කර ඇති අතර එහි නිර්දේශ මත ඉදිරියේදී ස්ථාවර වත්කම් ක්ෂය කිරීමට කටයුතු කරනු ලැබේ. | භාර සහ බුදල් අයත් අංශවලට වෙන් වෙන් වශයෙන් ස්ථාවර වත්කම් ලේඛන නඩත්තු කිරීමට සහ ස්ථාවර වත්කම් ක්ෂය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ග) | 1973 අංක 28 දරන සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම් (විශේෂ විධි විධාන) පනත මඟින් ලේක්හවුස් ආයතනය රජයට පවරා ගැනීමේදී රජය වෙනුවෙන් කොටස් දැරීම සඳහා මහා භාරකාරවරයා නම් කර තිබුණු අතර රජය වෙනුවෙන් මහා | භාර/බුදල් ගිණුම්වල හෙළිදරව් කර ඇත. | භාණ්ඩාගාරයේ උපදෙස් පරිදි කටයුතු කළ යුතුය |

| | | | |
|---|---|---|---|
| | භාරකාරතැන විසින් එම සමාගමේ සාමාන්‍ය කොටස් 3,050.379ක් එනම් සියයට 87.5ක හිමිකාරිත්වයක් ලබාගෙන තිබුණි. එසේ වුවද, ඒ සම්බන්ධව හා ඒ මත උපයන ලාභාංශ සම්බන්ධව දෙපාර්තමේන්තුවේ භාර/බූදල් ගිණුම්වලට ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි. | | |
| (ච) | මහාභාරකාර දෙපාර්තමේන්තුව යටතේ පවතින පෞරාණික වටිනාකමකින් යුත් කළුතර පළාතොට පිහිටි රිච්මන්ඩ් කාසල් ගොඩනැගිල්ල, නිසි කාලය තුළ විධිමත් පරිදි නඩත්තු කටයුතු සහ අළුත්වැඩියාවන් සිදු නොකිරීම හේතුවෙන් වහලයෙන් ජලය කාන්දුවී බිත්තිවලට හානි සිදුවී තිබුණු අතර ඇතැම් ස්ථාන පෞරාණිකත්වයට නොගැළපෙන ආකාරයට අළුත්වැඩියාවන් සිදු කර ඇති බවට නිරීක්ෂණය විය. ඒ අනුව නැවත අළුත්වැඩියාවක් සිදු කිරීම සඳහා 2023 අගෝස්තු මාසයේදී ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයෙන් තත්ත්ව වාර්තාවක් ලබා ගෙන තිබුණ ද අරමුදල් සපයා ගැනීමේ නොහැකියාව මත අළුත්වැඩියා කටයුතු සිදු කිරීමට නොහැකිව තවදුරටත් මන්දිරයට හානි සිදුවෙමින් පැවතුණි. | අරමුදල් සම්පාදනය කර ගැනීමේ නොහැකියාව මත අදාළ ඇස්තමේන්තුව ලබා ගැනීමට නොහැකි විය. කෙසේ වෙතත් අදාළ අළුත්වැඩියා කිරීම් සම්බන්ධයෙන් මේ වන විට අවධානය යොමු කර ඇති අතර ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ශ්‍රම දායකත්වය යොදා ගනිමින් පුරා විද්‍යා බලධාරීන්ගේ අධීක්ෂණය යටතේ ඉදිරි වර්ෂ කිහිපය තුළ මූලික නවීකරණ කටයුතු පෞරාණිකත්වයට හානියක් නොවන ආකාරයට සිදු කිරීමට බලාපොරොත්තු වේ. | මන්දිරයේ පෞරාණිකත්වය ආරක්ෂා වන අයුරින් කඩිනමින් අළුත්වැඩියාව සිදු කළ යුතුය. |
| (ජ) | රිච්මන්ඩ් මන්දිරයෙහි සිදු කළ යුතු හදිසි සහ අත්‍යාවශ්‍ය අළුත්වැඩියාවන් වෙනුවෙන් 2021 වර්ෂයේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ගෙන් | අරමුදල් ක්ෂණිකව සම්පාදනය කරගැනීමේ අපහසුතාවයකින් යුක්ත බව විටින් විට සිදු වූ සිදු වීම් සලකා බැලීමේදී පෙනී යයි. කෙසේ වෙතත් මූලික | අළුත්වැඩියාවන් කිරීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව විනිවිදභාවයකින් |

| | | | |
|---|---|---|---|
| | බැහැරව රු.755,335 ක් වැය කර එයින් රු.3,000ක් පමණක් රැඳවුම් මුදල් ලෙස අඩු කරගෙන තිබුණ ද, තවදුරටත් ජල කාන්දුවීම් සිදු වී සිවිලිමට සහ බිත්තිවලට හානි සිදු වෙමින් පැවති අතර පසුව ඇස්තමේන්තුවක් පිළියෙල නොකර විෂයභාර ලිපිකරු විසින් ඉදිරිපත් කරන ලද මිල ගණන් මත ද්‍රව්‍ය සඳහා රු.185,665 ක් හා වැඩ කුලී සඳහා රු.722,105 ක් වැයකර මන්දිරයේ පිටුපස බිත්තිවල පමණක් අඩි 12,122 ක ප්‍රමාණයක් නිසි ක්‍රමවේදයකින් තොරව කඩතොළු සහිතව තීන්ත ආලේප කර තිබුණි. | නවීකරණ කටයුතු ඉදිරියේදී යුද්ධ හමුදාවේ දායකත්වය ලබා ගනිමින් සිදු කිරීමට නියමිතය. නව පරිපාලන නිලධාරී සමග සාකච්ඡා කර අදාළ නවීකරණ කටයුතු පුරාවිද්‍යා බලධාරීන්ගේ අධීක්ෂණය යටතේ විධිමත් ආකාරයකට පියවර කිහිපයකට වෙන් කර සුදුසු සහ විනිවිදභාවයක් සහිත ප්‍රසම්පාදන ක්‍රමවේදයන් භාවිතා කරමින් මෙම පෞරාණික ගොඩනැගිල්ලේ අනන්‍යතාවයට හානියක් නොවන අයුරින් සිදු කර සංචාරක ආකර්ශනය වැඩි වන ආකාරයට ඉදිකිරීම් සිදු කර ඉහල ආදායමක් උපයා ගැනීම සඳහා විධිමත් සැලසුමක් සැකසීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | යුක්තව කටයුතු කළ යුතුය. |
| (ට) | 2020 වර්ෂයේදී හොරණ තෝප් වත්තේ පැවති අක්කර 6ක රබර් වගාව ඉවත් කර පොල් වගා කිරීම සඳහා රු.247,272ක වියදමකින් භූමිය සකස් කර පසුව එම භූමිය ද ඇතුළත්ව අක්කර 10.592 ක් 2021 වර්ෂයේ සිට පෞද්ගලික ඉදිකිරීම් ආයතනයකට බදු දී තිබීම හේතුවෙන් දරන ලද වියදම නිශ්කාර්ය බවට පත්වී තිබුණි. | මෙම තෝප් වත්ත පිහිටි ඉඩම අවට වේගවත් නාගරීකරණයක් සිදු වෙමින් පවතින අතර වගාවක් සිදුකර එය රැක බලා ගනිමින් වැඩි කාලයක් ආදායම් ලබා ගැනීමට ගත කිරීමට සාපේක්ෂව බදු පදනමින් ලබා දීමෙන් වැඩි ප්‍රතිලාභයක් ලැබිය හැකි වෙතැයි සලකා එවකට මහා භාරකාර තැන ඒ සඳහා අනුමැතිය ලබා දී ඇත. | නිවැරදි තීරණ ගත යුතු අතර යම් කාර්යයක් වෙනුවෙන් දරන ලද වියදම ඵලදායී විය යුතුය. එමෙන්ම කළමනාකරණය විසින් ඒ සම්බන්ධව පසුවිපරම් කළ යුතුය. |
| (ඩ) | රිච්මන්ඩ් පාර්ක් වත්තේ ඇති අක්කර 03 ක රබර් වගාව ඉවත් කිරීමෙන් ලැබෙන ආදායමින් කුරුඳු වගා කිරීමට යෝජනා කර පසුව කුරුඳු වගාව නොකර වර්ෂයකට වැඩි කාලයක් ගත වී තිබූ පොල් පැල, රු.678,700ක වියදමකින් මාස 7කට වැඩි කාලයක් ගත කර වගා කිරීමට කටයුතු කර | රබර් වගාව ඉවත් කිරීමෙන් අනතුරුව කිසියම් කාලයක් පස නැවත ප්‍රකෘතිමත් වීම සඳහා පැවතිය යුතු අතර පස සූදානම් කිරීමෙන් අනතුරුව වගා කටයුතු කිරීම සාමාන්‍ය සම්ප්‍රදායවේ. කොවිඩ් වසංගත තත්වය හා පැවති ඉන්ධන අර්බුදය මත කාර්යාල කටයුතු අඩපණවීම හේතුවෙන් කොන්ත්‍රාත් කරුගේ ඉල්ලීම | වැඩි ප්‍රතිලාභයක් ලැබෙන ආකාරයට වගාවන් විධිමත් ආකාරයට සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | තිබුණු අතර ලැබී තිබුණු පොල් පැල 260 න් පැල 28 ක් පමණක් ඉතිරිව තිබීමෙන් එම වගාවන්හි සාර්ථකත්වය පිළිබඳ සනාථ නොවීය. තවද, රබර් වගාව ඉවත් කිරීම සඳහා වූ කොන්ත්‍රාත්තු ගිවිසුම ප්‍රකාරව, ප්‍රමාද වූ දින 90ක් සඳහා දිනකට රු. 1000 ක් බැගින් අයකර ගත යුතු වූ රු.90,000 ක ප්‍රමාද ගාස්තුව අයකර ගැනීමට ද කටයුතු කර නොතිබුණි. | පරිදි වැඩි කාලයක් ලබා දීමට කටයුතු කර ඇත. | |
| (ත) | පෞරාණික වටිනාකමකින් යුත් කෞතුක භාණ්ඩ, රිච්මන්ඩ් මන්දිරයෙහි තැන්පත් කර සංරක්ෂණය කළ යුතු බව බුදල්කරුගේ අන්තිම කැමති පත්‍රයෙහි සඳහන් කර තිබුණ ද ඒ අතරින් කෞතුක භාණ්ඩ කිහිපයක් පමණක් දෙපාර්තමේන්තුවේ සේප්පුවක තබා ඇති බවත් අනෙකුත් කෞතුක භාණ්ඩ පවතින ස්ථානය පිළිබඳව සොයා බැලීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබූ බවත් නිරීක්ෂණය විය. | විගණන නිරීක්ෂණය හා එකඟ වේ. | බුදල්කරුගේ අන්තිම කැමති පත්රයෙහි සඳහන් ආකාරයට කටයුතු කිරීම සිදු කළ යුතුය. |
| (ද) | අයි.ඩබ්ලිව්.සී. විජේරත්න බුදලයට අයත් නෝර්ටන් බ්‍රිජ්හි පිහිටි නිවස හා ඉඩම 1993 දෙසැම්බර් 07 දින වැඩිහිටි නිවාසයක් පවත්වා ගෙන යෑම සඳහා ගිනිගත්හේන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත භාරදී තිබුණ ද එම දේපළ භාරදීම, නඩත්තු කිරීම යනාදී කරුණු ඇතුළත් විධිමත් ගිවිසුමකට එළඹ නොතිබුණි. | ගිනිගත්හේන ප්‍රාදේශිය ලේකම් ප්‍රධානත්වයෙන් භාරකාර මණ්ඩලයක් පිහිටුවීමටත් වැඩිහිටි නිවාසය පවත්වාගෙන යාමට අදාළව ආරක්ෂක භාරකරු ලෙස මහා භාරකාර තැන පත්කර භාරයක් පිහිටුවීමටත් අවශ්‍ය කටයුතු සිදු කර ඇත. | බාහිර පාර්ශවයන්ට බුදල් දේපල බදු පදනමින් ලබා දීමේදී විධිමත් බදු ගිවිසුම්වලට එළඹිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ප) | සී. ඊ. වනිගසූරිය බූදලයට අයත් දේපළ විකුණා බූදල්කරුගේ නමින් භාරයක් පිහිටුවීම සඳහා මහා භාරකාරතැන වෙත 2005 වර්ෂයේදී අද්මිනිස්ත්‍රාසි බලතල ලැබී තිබුණ ද ඇතැම් ඉඩම් කොටස් සහ ඊට ඇතුළත් ගොඩනැගිලිවල හිමිකාරීත්වය හඳුනා ගෙන මහා භාරකාරතැනගේ අයිතිය තහවුරු වන පරිදි ආරක්ෂා කිරීමටත්, එම දේපළ විකුණා බූදල්කරුගේ අරමුණු ඉටුකිරීමටත් කටයුතු කර නොතිබුණි. | අන්තිම කැමති පත්‍රයට අනුව සී.ඊ. වනිගසූරිය බූදලයට අයත් දේපළ කිහිපයක් (සේදවත්ත 220/3 ඉඩම,වැල්ලවත්ත ස්ටේෂන් ඇවනියු හි අංක 27,29 දරණ දේපළ) නිසි පරිදි හඳුනා ගෙන එම දේපල විකුණා සී.ඊ. වනිගසූරිය භාරය නමින් තැන්පත් කර අදාළ අරමුණු ඉටු කරමින් පවතී. කඩවත මිරිස්පැලවත්ත නැමැති දේපළද අධිකරණ නියෝගයක් මඟින් රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයට පවරා ඇත. අනෙකුත් දේපල සඳහා සී.ඊ. වනිගසූරිය මහතාට ඇත්තේ නොබෙදූ පංගු හිමිකාරීත්වයක් බැවින් අදාළ හිමිකාරීත්වය හඳුනා ගත යුතුය. එකී නොබෙදූ දේපලවල අනවසර පදිංචිකරුවන් සිටින බැවින් නිසි අධිකරණ ක්‍රියාමාර්ග ගෙන නිරවුල් කිරීමට සිදුව ඇත. | අදාල ඉඩම් හා ගොඩනැගිලි හඳුනාගෙන මහා භාරකාරතැනගේ අයිතිය තහවුරු කර බූදල්කරුගේ අරමුණු ඉටුකිරීමට කටයුතු කළ යුතුය. |

## 4. යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශය විසින් සමාලෝචිත වර්ෂයට අදාලව නිකුත් කර තිබූ විගණන විමසුම් අතුරින් විමසුම් 15ක් සඳහා කළමනාකරණය විසින් පිළිතුරු සපයා නොතිබුණි. | කඩිනමින් විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීමට කටයුතු කරනු ලැබේ. | අභ්‍යන්තර විගණන විමසුම් සඳහා අප්‍රමාදව පිළිතුරු සැපයිය යුතුය. |

## 5. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2001 අගෝස්තු 22 දිනැති අංක 18/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව, වර්ෂ 5ක් එකම සේවා ස්ථානයෙහි සේවය කර ඇති සෑම නිලධාරියෙකුටම වෙනත් සේවා ස්ථානවල සේවය කිරීමට ඉඩදීම සඳහා ස්ථාන මාරු ලබා දිය යුතු වුවත්, දෙපාර්තමේන්තුව තුළ වර්ෂ 5 ඉක්ම වූ නිලධාරීන් 22 ක් සඳහා ස්ථාන මාරුවීම් ලබා දීමට කටයුතු කර නොතිබුණි. | වාර්ෂික ස්ථානමාරුවීම් වලදී වර්ෂ 05 ට වැඩි නිලධාරීන්ගේ තොරතුරු ඇතුළත් ආකෘති පත්‍රය සෑම වර්ෂයකම ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කරනු ලබන අතර මෙතෙක් ස්ථාන මාරුවීම් නොලද නිලධාරීන්ද සිටින බව දන්වමි. | රාජ්‍ය පරිපාලන අමාත්‍යංශය සමඟ සම්බන්ධීකරණය වී දිගු කාරලයක සිට ආයතනයේ සිටින නිලධාරින් සඳහා ස්ථාන මාරුවීම් ලබාදීමට කටයුතු කල යුතුය. |